සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

# 11 - ශ්‍රේණිය

# ක්‍රිස්තියානි ධර්මය - I

නම / විභාග අංකය : ........................................................................ කාලය පැය 01 යි

**සැලකිය යුතුයි.**
**(i) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

දී ඇති වරණ අතුරෙන් නිවැරදි වරණය තෝරන්න.

01. ජුදෙව් පිරිමි බිළිඳු දරුවන් චර්මච්ඡේදනය කිරීමෙන් අපේක්ෂා කරන ලද්දේ,
   i. පාරම්පරික උරුමයන් රැකගැනීමයි.
   ii. දරුවාට අර්ථවත් නමක් තැබීමයි.
   iii. දේව සම්බන්ධතාවය ඇති කිරීමයි.
   iv. පූජකත්වයට දරුවා භාර කිරීමයි.

02. 'ජොහාන්' යන නාමෙහි අර්ථය නම්,
   i. 'සිනාසීම' යන්නයි
   ii. 'පාළුකරයේ හැසිරෙන්නා' යන්නයි
   iii. 'මෙහෙසුරු දිව්‍යසිවරයා' යන්නයි
   iv. 'දෙවියන් වහන්සේගේ දායාදය' යන්නයි

03. කිතු උපත සැමරීමේදී අප
   i. 'තුති පූර්වක හදවතකින් දෙවියන් වහන්සේ වෙත ළඟාවිය යුතුය.'
   ii. දිළිඳුන්ට විශේෂයෙන් ඇරයුම් කළ යුතුය.
   iii. පසුගිය වසරට වඩා සංවිධානාත්මකව සියල්ල පිළියෙළ කළ යුතුය.
   iv. උත්සවශ්‍රීය අන් අයට හඟවෙන පරිදි ක්‍රියා කළ යුතුය.

04. සැබෑ මනස් ස්ථාපනයේ ප්‍රථම පියවර ලෙස හඳුනාගත හැකිවනුයේ,
   i. දෙවිඳුන්ට පව් කියා පෑමයි
   ii. ජලයේ ගිලී ස්නානය කිරීමයි
   iii. පූජකතුමා වෙත ගොස් පව් කියාපෑමයි
   iv. තම තමන්ගේ පව් පිළිගැනීමයි

05. පහත පිළිතුරු අතුරින් ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් දොළොස් දෙනාට අදාළ වාක්‍ය ඛණ්ඩය නම්,
   i. 'ඔවුන්ගෙන් බොහෝ අය ස්නාවක ජොහාන්ගේද ශ්‍රාවකයෝය' යන්නයි.
   ii. 'ඔවුහු විවිධ රැකියාවල යෙදුණු විෂම පසුබිම් හා තරාතිරම්වලට අයත්වූවෝය' යන්නයි.
   iii. 'ඔවුහු ඉශ්‍රායෙල් ගෝත්‍ර දොළොසෙහි නායකයෝ වූහ. යන්නයි.
   iv. 'ඔවුහු ජෙරුසෙලමේ වාසස්ථාන ඉදිකොට සිය පවුල් ඒවාහි පදිංචි කරවූහ' යන්නයි.

06. ජේසුස්වහන්සේට පැමිණි ප්‍රථම පරීක්ෂාව,
   i. චිත්තාකර්ෂණීය ක්‍රියාවන් තුළින් මිනිසුන් ආකර්ෂණය කිරීම පිළිබඳවය.
   ii. දේව පුත්‍රභාවය සැක කිරීම පිළිබඳවය.
   iii. මානසික හා අධ්‍යාත්මික අවශ්‍යතාවන් ඉටුකරදීම පිළිබඳවය.
   iv. සමාජයේ කීර්තිය හා වස්තුව නැමදීමට යොමුවීම පිළිබඳවය.

07. ධර්මදූතයන් සැත්තෑදෙනා මෙන් අපද ලබන අත්දැකීමකි
   i. දේවසේවයට කැප වූ විට අවශ්‍යතා දෙවියන්වහන්සේ වෙතින් නොඅඩුවම සැපයීම
   ii. සැමදෙනාගේම පිළිගැනීමට ලක්වීම
   iii. රැකියාවන්හී ප්‍රායෝගික පුහුණුවක් ලැබීම
   iv. දේවරාජ්‍යය ක්‍රියාවෙන් නොව වදන් මගින් ප්‍රකාශ කිරීම

08. "අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමැත්තහුද?"
   i. ඔබත් දයානුකම්පාව ඇතිව සිටින්න.
   ii. ඔබත් ඔවුන්ට ඒ දේම කරන්න.
   iii. ඔබත් ඔවුන්ට අභියෝගයක් වන්න.
   iv. නිරතුරුවම ඔබ දෙවිඳුන්ට ඒ පිළිබඳව පැමිණිලි කරන්න.

09. දේව රාජ්‍යය ඉදිරියට ගෙනයෑමේ කැඳවීම ලබා ඇති කිතුනුවන්,
   i. දේවරාජ්‍යය පිළිබඳව පුළුල් ඉගැන්වීම් මාලාවක් වෙත යොමුවිය යුතුය
   ii. දුබලයන් අතුරෙන් ප්‍රබලයන් තම සහායට තෝරාගත යුතුය
   iii. දේව මඟ පෙන්වීම යටතේ ඒ කාර්යභාරය වගකීමෙන් යුතුව ඉටුකළ යුතුය
   iv. තමාට අභියෝග ඉදිරිපත් කරන්නන් සැමවිටම පරාජය කළ යුතුය

10. ජේසුස් වහන්සේ අවධාරණය කළ පරිදි දරුවන් වෙතින් ඉගෙනගත යුතු වැදගත්ම ගුණාංගය නම්,
   i. දයාවයි   ii. නිහතමානීත්වයයි   iii. සමාවදීමයි   iv. ඉවසීමයි

11. දුක් උසුලන සේවකයාණන් මගින් වර්තමානයේ කිතුනුවන්ට ලැබෙන මඟපෙන්වීමක් වනුයේ,
   i. දුක් විඳින ජනයාට මුද්‍රිත ශුද්ධ ලියවිලි පාඨ ලබාදීමයි
   ii. හැකි පමණින් සම්පත් රැස්කර ගැනීමට උත්සුක වීමයි
   iii. සැම විටම පරිත්‍යාගශීලීව කටයුතු කරමින් සමානාත්මතාවය ගොඩනැගීමට අතදීමයි
   iv. දුක, පොදු ධර්මතාවක් ලෙස සලකමින් අසාධාරණය හමුවේ නිහඬව සිටීමයි

12. දේවරාජ්‍යයේ ලකුණු සම්බන්ධයෙන් එහි පුරවැසියන්ගේ වගකීම නම්,
   i. එම ලකුණු හැකි පමණින් අන්‍යයන් අතර සිදුකිරීමට ප්‍රයත්න දැරීමයි
   ii. එම ලකුණු පරම්පරාවෙන් පරම්පරාවට ව්‍යාප්ත කරලීමට වගබලා ගැනීමයි
   iii. එම ලකුණු තුළින් මානව සංහතිය තුළ වෙනස්කම් ඇති කිරීමට ක්‍රියා කිරීමයි
   iv. එම ලකුණු තම ජීවිත තුළින් හුවා දක්වමින් දිරිමත් ලෙස දේවසේවයේ නිරතවීමයි

13. සද්දුසිවරුන් නැගූ ප්‍රශ්නයකට ජේසුස් වහන්සේ ප්‍රති ප්‍රශ්නයක් නැගුයේ,
   i. අධිරාජයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නයේදීය   ii. පුනරුත්ථානය පිළිබඳ ප්‍රශ්නයේදීය
   iii. කුරුසියේ ඇණගැසීම පිළිබඳ ප්‍රශ්නයේදීය   iv. අධිකාරි බලය පිළිබඳ ප්‍රශ්නයේදීය

14. තාර්සස් හි පරිසියකු ලෙස ඇති දැඩි වූ සාවුල් 'විජාතීන්ගේ අපෝස්තුළුවරයා' බවට පත්වීම සනාථ කරන්නේ,
   i. අග්‍රිපා හා බර්නිස් ඉදිරියේ කළ කථාවය
   ii. ලිදියා හා හිරගෙයි මුලාදෑනියා බව්තීස්ම කිරීමය
   iii. අකිලා හා ප්‍රිස්කිලා සමඟ සේවය කිරීමය
   iv. බාර්ණබස් හා මාක් සමඟ ධර්මදූත ගමනක් යෑමය

15. කිතුනු පවුලක් තුළ ඇතිවන ගැටළුවලට වඩාත් සාර්ථක ලෙස මුහුණදීම සඳහා
   i. පවුලේ සාමාජිකයන් අතර යහපත් ප්‍රේමණීය සබඳතා වර්ධනය කරගත යුතුය
   ii. ජනමාධ්‍යවලින් දරුවන් හැකිතරම් ඈත්කළ යුතුය
   iii. සමාජ දූෂණ හා වංචාවලට එරෙහිව හඬ නැගිය යුතුය
   iv. හැකි පමණ වෙහෙස වී මුදල් ඉපයිය යුතුය

16. කිරේනියේ සීමොන් හා අරිමාතියේ ජෝසෙප් තුළින් චරිතායනය කළ හැකි කිතුනු ලක්ෂණ නම්,
   i. සැම විටම සමාජයේ විශේෂ ස්ථාන ලැබීමට හුරුවීමය.
   ii. නිහඬ මෙන්ම සන්සුන් ජීවිතයක් ගෙවීමය
   iii. ජේසුස්වහන්සේ පිළිගෙන අනුගාමී වීමය
   iv. නිරතුරුවම ජයාන්විත පුද්ගලයන් ඇසුරු කිරීමට යොමුවීමය

17. කිතුනු පාසල් සිසුසිසුවියන් වශයෙන් දුක් විඳින ජන කොටසක් වෙනුවෙන් ඉටු කළ හැකි සරලම ක්‍රියාකාරකමක් වන්නේ,
   i. එම ජනයා තමා අයත් සභාවට ඇතුලත් කර ගැනීමට කටයුතු කිරීමයි
   ii. එම ජනයාට සෙත සැලසීම සඳහා නීති සම්පාදනය කිරීමයි
   iii. එම ජනයාට ණය ආධාර ලබාදීමට මඟපෑදීමයි
   iv. එම ජනයා යාච්ඤාව තුළින් සවිමත්කර දේව වචනය තුළින් බලාපොරොත්තුවක් ලබාදීමයි

18. 'ග්‍රීක් කෘති පිළිබඳවත්, සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස පිළිබඳවත් පාවුල්ට තරුණ වියේ පටන් මනා දැනුමක් තිබිණි' යන ප්‍රකාශනය මගින් ගම්‍ය වන සත්‍යතාව නම්,
   i. පාවුල්තුමා ජුදෙව්වකු වුවද ග්‍රීක්වරුන්ට වඩාත් ඇළුම් කළ බවයි
   ii. පාවුල්තුමාගේ පසුකාලීන මෙහෙවර සඳහා සිය අතීත පසුතලය උපකාර වූ බවයි
   iii. අන්‍යාගමික විශ්වාස පතල කිරීමට පාවුල්තුමා දායකත්වය දැක්වූ බවයි
   iv. පාවුල්තුමා දැනුම පිපාසයෙන් කටයුතු කළ කෙනකු බවයි

19. පහත දැක්වෙන්නේ සිසුවකු විනයධරයන් පිළිබඳ ලියූ වගන්ති කීපයකි.

විනයධරයන් →
A - ඉසිලිය නොහැකි බර මිනිසුන් පිට පැටවීම
B - පුනරුජ්ජීවනය විශ්වාස නොකිරීම
C - පැරණි දිවැසිවරයන්ගේ සොහොන්කොත් ගොඩනැගීම
D - ලිඛිත ව්‍යවස්ථාව පමණක් පිළිගැනීම

මේ අතරින් නිවැරදි වන්නේ,

i. A හා B ය　　ii. B හා C ය　　iii. C හා A ය　　iv. D හා C ය

20. මුල් කිතුනු සභාව තුළින් අපට චරිතායනය කළ හැකි ගුණාංග නම්,
   i. ඒකත්වය, දයාව හා ඉවසීමයි
   ii. සමාවදීම, ඒකත්වය හා සාධාරණත්වයයි
   iii. ඉවසීම, සමාවදීම හා නිහතමානීත්වයයි
   iv. සාධාරණත්වය, නිහතමානීත්වය හා දයාවයි

21. කමාව පිළිබඳව කිතුනුවන් වෙත ඉදිරිපත්ව ඇති කොන්දේසිය නම්,
   i. කමාවේ සීමාවන් කිතුනුවන් විසින්ම තබාගත යුතු බවය
   ii. අපට වරද කරන අයට අප විසින් සම්පූර්ණයෙන්ම කමා විය යුතු බවය
   iii. අපගෙන් ණය ලබාගත් අය මුළුමනින් ඉන් නිදහස් කළ යුතු බවය
   iv. අප පාපයට නැඹුරුවූ අවස්ථා ක්‍රම ක්‍රමයෙන් අමතක කළ යුතු බවය

22. ජේසුස්වහන්සේ පරිසිවරුන්ට අවධාරණය කිරීමට ප්‍රයත්න දැරූ සත්‍යතාව වන්නේ,
   i. ව්‍යවස්ථාවට අදාළ බාහිර පැවතුම් ඉක්මවා යන මනුෂ්‍යත්වයක් වෙනුවෙන් කැපවීමේ අවශ්‍යතාවයයි.
   ii. අන් අයගෙන් වෙන්වූ විශේෂිත නායකත්ව ගුණාංග එළිදැක්වීමේ අවශ්‍යතාවයයි
   iii. සිය ධාර්මික බව අන් අයට විශේෂයෙන් දැන්වීමේ අවශ්‍යතාවයයි
   iv. නිරන්තර විවාද මගින් බාහිර බලවේග පරාජය කිරීමේ අවශ්‍යතාවයයි

23. [ ජේසුස්වහන්සේගේ ඉගැන්වීම ] → [ මෙලොවට අවශ්‍ය විමුක්තිය ලබාගැනීම ] ↓ [ ]

ඉහත කොටුවට අදාළ පිළිතුර නම්,

i. මිනිස් සමාජය වර්ධනය කිරීමයි　　ii. ජාතික මමත්වය ඇති කිරීමයි
iii. පාරම්පරික උරුමය වර්ධනය කිරීමයි　　iv. මිහිපිට දේවරාජ්‍යය පිහිටුවීමයි

24. නැති වූ පුත්‍රයාගේ උපමාව අනුගමනය කරන ඔබ පන්තියේ සිටින නොමඟ ගිය මිතුරකුට
    i. පන්තිභාර ගුරුවරයා තුළින් අවවාද කළ යුතුයි.
    ii. ප්‍රසිද්ධියේ ඔහුගේ වැරදි පෙන්වා දිය යුතුයි.
    iii. ඔහු සමගම සිටිමින් දේව ප්‍රේමය ඔහුට දැනෙන්නට සැලැස්විය යුතුය.
    iv. ඔහුගේ වැරදි නැවත සකස් කරගන්නා ලෙස ආයාචනා කළ යුතුය.

25. දේවරාජ්‍යයේ වර්ධනය වෙනුවෙන් අප,
    i. ජනතාවගේ සහාය සැමවිටම අපේක්ෂා කළ යුතුය.
    ii. සභාවන්වල නිරීක්ෂණ කමිටු පත් කළ යුතුය.
    iii. විශාල ව්‍යාපෘති අරඹා ඒවා ඉදිරියට ගෙන ගිය යුතුය.
    iv. දේව බලය ක්‍රියාත්මක වීම කෙරෙහි පූර්ණ විශ්වාසය තැබිය යුතුය.

26. පීඩාවට පත්වූවන් සම්බන්ධයෙන් ජේසුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරන අප,
    i. යාචකයන් සඳහා මහල් නිවාස ඉදි කිරීමට සහාය විය යුතුය.
    ii. සමාජය විසින් කොන් කරන ලද පුද්ගලයින් නැවත සමාජයට පිළිගැනීමට කටයුතු කළ යුතුය.
    iii. යුද්ධය නිසා අවතැන්වූ දරුවන් පමණක් ළමා මෙහෙකාර සේවයට යොදා ගත යුතුය.
    iv. අවශ්‍යතා ඇති අය සඳහා විදේශාධාර මගින් අරමුදලක් ආරම්භ කළ යුතුය.

27. ජීවිතයේ සැබෑ අර්ථයක් අත්දකීමට යෞවනයන් විසින් කළ යුතු මූලික ම කාර්යය වන්නේ,
    i. සිය කාය ශක්තිය වර්ධනය කරගැනීමයි.
    ii. තම හොඳ නම රැකගැනීම වෙනුවෙන් සමාජ සේවා ව්‍යාපාරවල නිරතවීමයි.
    iii. ශරීරය හා මුළු පැවැත්ම ශුද්ධාත්ම වැඩ විසීමට සුදුසු පවිත්‍රත්වයෙන් තබා ගැනීමයි.
    iv. හැකි තරම් අධ්‍යාපන සුදුසුකම් ලබමින් දිනෙන් දින දියුණුවන ලෝකය වෙත යොමුවීමයි.

28. රූප විපර්යාසය පිළිබඳ සිදුවීම තුළින්,

    A = ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය සම්පූර්ණත්වයට පත්විය.
    B = ජේසුස් වහන්සේගේ මිනිස් ස්වාභාවය එළිදරව් විය.
    C = ශුද්ධ ත්‍රිත්වය දර්ශනය විය.
    D = ශ්‍රාවකයන්ට හරි දුක්මක් ලැබිණි.

    ඒ අතුරින් නිවැරදි වන්නේ,
    i. A හා B ය
    ii. B හා C ය
    iii. C හා D ය
    iv. D හා A ය

29. 'නව සහජීවනය' යනුවෙන් හැඳින්වෙන්නේ,
    i. මමත්වය මධ්‍යගත නොවූ සබඳතාය.
    ii. දිළිඳුන් තුළ ඇතිවන අනාරක්ෂිත තත්ත්වයයි.
    iii. මෑතකදී ශ්‍රී ලංකාවේ අරඹන ලද නව නිකායකි.
    iv. බෙදීම් වලින් ගහණ වූ සංස්කෘතියකි.

30. දේව මාළිගයේ තිරය දෙකඩ වීමෙන් සංකේතවත් වන්නේ,
    i. සදාචාරයට පටහැනි ක්‍රියාවන් කිරීමෙන් සියලු ජනයා වළක්වා නොගතහොත් මුළු ජාතිය පිට දේව සාපය හා දඬුවම පැටවෙන බවයි.
    ii. දේව මාළිගය තුළ පරිපාලනමය කටයුතු නිසි පරිදි සිදු නොවන බවයි.
    iii. දේව මාළිගයේ තිරය තුළින් මතුවන ඓතිහාසිකමය වැදගත්කම රක්ෂා කළ යුතු බවයි.
    iv. ජේසුස් වහන්සේගේ දිවි පිදීම හේතුවෙන් දෙවියන්වහන්සේ හා මානව සංහතිය අතර සබැඳියාව කිසිදු බාධකයක් නොමැතිව සදහටම ස්ථිර ලෙස ස්ථාපනය වූ බවයි.

31. අපගේ ජීවිතවල උදාවන ජුබිලි වර්ෂවලදී,
   i. අපගේ නිවෙස්වල සිටින මෙහෙකරුවන්ට සම්පූර්ණ නිදහස ලබාදිය යුතුය.
   ii. අපගේ ජීවිතවල වහල්භාවයන් මුලිනුපුටා දමා නව අනන්‍යතාවයක් සමඟ නිදහසේ නව ජීවිතයක් ගත කිරීමට පියවර තැබිය යුතුය.
   iii. විශේෂ ව්‍යවස්ථාවක් සකසා ගනිමින් ඒ අනුව ආගමික දිවියක් ගත කිරීමට ප්‍රයත්න දැරිය යුතුය.
   iv. අප මිලදී ගත් සියලුම ඉඩකඩම් විකුණා දමා එම මුදල් ඒවායේ පළමු හිමිකරුට ලබා දිය යුතුය.

32.

| දැක්ම (i) | අත්දැකීම (ii) | වත්මන් සංදර්භය තුළ (iii) |
|---|---|---|
| දේවරාජ්‍යය | නැවත ඉපදීම | A - තම නිකාය අතහැර වෙන නිකායක සමාජිකත්වය ලැබීමය<br>B - වනගත වී සංසුන් වීමය<br>C - කිතුනු ආකල්ප අනුව ජීවිත පරිවර්තනයක් ඇතිකර ගැනීමය<br>D - දෙවන වරට බෞතීස්මය ලබා යම් සේවයකට කැපවීමය |

ඉහත (iii) වන කොටසට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,
   i. A ය.   ii. B ය.   iii. C ය.   iv. D ය.

33. පාවුල්තුමා සඳහන් කරන ප්‍රේම පාරමිතාව අඩංගු වන්නේ,
   i. පිලිප් වාසීන්ට ලියන ලද හසුනේය.
   ii. එපීසවාසීන්ට ලියන ලද හසුනේය.
   iii. රෝමවරුන්ට ලියන ලද හසුනේය
   iv. කොරින්තිවරුන්ට ලියන ලද හසුනේය

34. ඔබේ සිරුරට පහන ඔබේ ඇසය → [ ] / [ ]
   A - ශුද්ධාත්මාලෝකය සඟවා තැබීම
   B - ශුද්ධාත්මාලෝකයෙන් ආලෝකවත් වීම
   C - ශුද්ධාත්මාලෝකය ඇද ගැනීම
   D - ශුද්ධාත්මාලෝකය ජීවිත ක්‍රියාවලියෙන් අනාවරණය කිරීම

එම පිළිතුරු අතුරින් ඉහත කොටු යුගලයට වඩාත් අදාළ පිළිතුරු වන්නේ
   i. A හා B ය.   ii. B හා D ය.   iii. C හා A ය.   iv. D හා C ය.

35. දේවමාළිගය පවිත්‍ර කිරීමේ සිදුවීම මගින් වත්මන් කිතුනුවන්ට ලැබෙන අභියෝගය නම්,
   i. දේවස්ථාන, සියලුම කිතුනුවන්ට දේව ගෞරවය හා යාච්ඤාව සඳහා යොදා ගැනීමට මං පෙත් විවර කරදීමයි.
   ii. දෙව්මැදුරු සඳහා අරමුදල් එක්රැස් කිරීම දේවස්ථානයෙන් පිටතදී සංවිධානය කිරීමයි.
   iii. සියලුම දේවස්ථාන විවෘත දේවස්ථාන බවට පත් කිරීමය.
   iv. දේවස්ථාන තුළ පවතින සියලුම ගතානුගතික විධි ඉන් බැහැර කිරීමයි.

37. ස්වාමින්වහන්සේගේ යාච්ඤාවේ හරය වන්නේ,
   i. 'අපගේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව' යන්නයි.
   ii. 'අප පරීක්ෂාවට නොපමුණුවා නපුරෙන් අප ගළවා ගත මැනව' යන්නයි.
   iii. 'ඔබගේ රාජ්‍යය ඒවා ඔබගේ කැමැත්ත කරනු ලැබේවා' යන්නයි.
   iv. 'අපගේ වැරදිවලටත් කමාවුව මැනව' යන්නයි.

38. සිය කැමැත්තෙන්ම දිළිඳු භාවයට පත්ව ලෝකයා තුළ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය මාංශවත් කළ පුද්ගලයකි,
   i. ඩෙස්මන්ඩ් ටුටු
   ii. II වන එලිසබෙත් රජිණ
   iii. තෙරේසා මව්තුමිය
   iv. ඒබ්‍රහම් ලිංකන්

39. ක්‍රිස්තුස් වහන්සේ හා ග්‍රීක්වරුන් අතර ඇතිවූ සංවාදයේ සම්පිණ්ඩනයක් මත පහත වගුව නිර්මාණය කර ඇත.

| අපේක්ෂාව | ක්‍රියාකාරී චර්යාව | ප්‍රතිචාරය |
|---|---|---|
| කිතුනු අනුගාමිකත්වය | සේවය හා එළදැරීම | A - වෙනස්කම් අධ්‍යයනය කිරීම<br>B - ලෝකයාට ප්‍රකාශවීම<br>C - තමාට ආවේණික රටාවක් ගොඩනගා ගැනීම<br>D- පූර්ණ ලෙස වැයවීම |

ඉහත ප්‍රතිචාර අතුරින් කිතුනුවාට වඩාත්ම අදාළ වන්නේ,
   i. A ය.
   ii. C ය.
   iii. B ය.
   iv. D ය.

40. කිතුනුවන්ට හිමිවූ විනාශ නොවන බලාපොරොත්තුව නම්,
   i. අපගේ සතුරන්ට කෙදිනක හෝ දඬුවම් ලැබෙන බවය.
   ii. දේව රාජ්‍යයේ ගුණධර්ම වලට එකගව දිවිගෙවීමෙන් සදාතන දිවි උරුම වන බවය.
   iii. ජීවිතයේ කිසිදු දිනක ස්වාභාවික ව්‍යසනවලට ගොදුරු නොවන බවය.
   iv. ලොව දිවිගෙවන සැමදෙනාටම යහපත් ආර්ථික තත්ත්වයක් නොබෝ දිනකින් උදාවන බවය

(ල. 1 X 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## ක්‍රිස්තියානි ධර්මය - II

නම / විභාග අංකය : ................................................................................ කාලය පැය 02 යි

- පළමු අනිවාර්ය ප්‍රශ්නය හා තවත් කැමති ප්‍රශ්න 4 ක් ඇතුළුව සියලුම ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

1. මෙම ප්‍රශ්නය අනිවාර්ය වේ.

i) ජේසුස් වහන්සේගේ මිහිපිට සේවයේ ප්‍රතිපත්තීන් ප්‍රකාශ වූ අවස්ථාව නම් කරන්න.

ii) පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨය සම්පූර්ණ කරන්න.

දිළිඳු වූ ඔබ භාග්‍යවන්තයෝය. මන්ද ඔබ ........................................

iii) 'දේව රාජ්‍යයේ නීතිය' වශයෙන් ජේසුස් වහන්සේ හඳුන්වා දුන්නේ කුමක්ද?

iv) සේවක නායක භූමිකාවට අයත් විශේෂාංග 2 ක් ලියන්න.

v) අ) නව ගිවිසුමෙහි කේන්ද්‍රික සිද්ධිය කුමක්ද?

ආ) එම සිදුවීම තුළින් අප විශ්වාසයෙන් පිළිගත යුතුවූ සත්‍යතාව කුමක්ද?

vi) පහත සඳහන් කොටුවට අදාළ පිළිතුර ලියා දක්වන්න.

යුදෙව් බලාපොරොත්තුව ⟶ දේශපාලන නිදහස

මෙසියස් වහන්සේ තුළ බලාපොරොත්තුව ⟶ [ ]

vii) පාවුල්තුමා සිය දෙවන ධර්මදූත චාරිකාවේදී මුහුණදුන් අභියෝග 2 ක් නම් කරන්න.

viii) අ) වත්මන් ලොව තුළ සිදුවන ස්වාභාවික ව්‍යසන සඳහා නිදසුන් 2 ක් සපයන්න.

ආ) ස්වාභාවික ව්‍යසන හමුවේ කිතුනුවන්ට ඉටුකළ හැකි කාර්යයන් 2 ක් ලියන්න.

ix) යුදෙව් සමාජයෙන් වත්මන් කිතුනුවන්ට ආදර්ශනය කළ හැකි වටිනාකම් දෙකක් ලියා දක්වන්න.

x) 'සැබෑ මිදිවැල' නමැති රූපකය මගින් ජේසුස්වහන්සේ අපට උගන්වන වැදගත් පාඩම කුමක්ද?

(ලකුණු 2 x 10 = 20)

2. 'මා පියාණන්ගේ මැඳුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නාහුද?'

i. ඉහත ප්‍රශ්නය යොමුකරන ලද්දේ කවරකු විසින්ද? කා වෙතද? (ල. 2)

ii. එම ප්‍රශ්නය ඉදිරිපත් කළ පුද්ගලයා හොඳින් අවබෝධ කරගෙන සිටියේ යැයි පැහැදිලි වන සත්‍යතාව කුමක්ද? (ල. 3)

iii. තරුණ කිතුනු සමුළුවක් අවස්ථාවක කිතුනු දරුවන් දිරිමත් කිරීම සඳහා ඔවුන් අතර බෙදාහැරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකසන්න.
(අවම වශයෙන් එහි කරුණු 5 ක් වත් ඇතුලත් විය යුතුය.) (ල. 5) (ල. 10)

3. 'මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයකි'

i. මෙහි 'මොහු' යන්නෙන් ජේසුස් වහන්සේ ව්‍යවහාර කළේ කා හටද? (ල. 2)

ii. ජේසුස්වහන්සේ හමුවීමෙන් එම පුද්ගලයාගේ ජීවිත පරිවර්තනයක් සිදුවූ බවට සාධක 2ක් ලියා දක්වන්න. (ල. 3)

iii. සිය පාපය හේතුකොටගෙන ජේසුස් වහන්සේ තුළ ගැළවීම අහිමි වේ යැයි සිතමින් අධෛර්යයට පත්ව සිටින මිතුරකු දිරිමත් කිරීම සඳහා ලිපියක් රචනා කරන්න. (ල. 5)

(ල. 10)

4. 'මා සිහිකිරීම පිණිස මෙය සිදුකරන්න'

i. ඉහත ඉල්ලීම කුමන කෘත්‍යයක් සම්බන්ධයෙන්ද? (ල. 2)

ii. එම කෘත්‍යය තුළින් විදහා දක්වෙන ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 3)

iii. ඉහත සඳහන් ඉල්ලීමට ඔබ කිතුනුවකු ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය පහදන්න. (ල. 5)

(ල. 10)

5. 'සමිඳුණෙනි මා එඬේරාණෝය, අඟ හිඟ මට නොවන්නේය.'

i. පැරණි සමාජයේ එඬේරකුට භාර වූ කාර්යයන් 2 ක් ලියන්න. (ල. 2)

ii. ජේසුස් වහන්සේ මිහිපිට සේවය තුළ, එඬේර භූමිකාව ඉටු කළ අවස්ථා 3 ක් ලියා දක්වන්න. (ල. 3)

iii. ඔබේ පාසල් සමාජය තුළ ඔබට එඬේරකු ලෙස ක්‍රියාකළ හැකි ආකාරය නිදසුන් මගින් පහදන්න. (ල. 5)

(ල. 10)

6. 'යහපත් හවුල් නායකත්වයක් තුළින් සාර්ථක මෙහෙවරකට අඩිතාලම.'

i. පාවුල් හා බාර්ණබස් තුළින් යහපත් හවුල් නායකත්වයක් ඉස්මතු වූ අවස්ථා 2 ක් නම් කරන්න. (ල. 2)

ii. හවුල් නායකත්වය තුළ පාවුල් හා බාර්ණබස් මුහුණ දුන් අභියෝගාත්මක අවස්ථාවක් පැහැදිලි කරන්න. (ල. 3)

iii. ඔබේ පාසල් සමාජය තුළ සාර්ථක ලෙස හවුල් නායකත්ව සංකල්පය යොදාගත හැකි ආකාරය පහදන්න. (ල. 5)

(ල. 10)

7. 'වෘකයා බැටළුවා සමඟ වාසය කරයි. දිවියා එළු පැටවා සමග' ලගියි.'

i. 'ශාලොම්' හා 'අයිශ්‍රේනියා' යන පදවල අර්ථ පහදන්න (ල. 2)

ii. බහු වාර්ගික සමාජයක ස්ථිරසාර සාමයක් ඇති කිරීම සඳහා ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කරන්න. (ල. 3)

iii. ඔබ ජීවත්වන සමාජය තුළ සාමය ස්ථාපිත කිරීම සඳහා කිතුනුවකු ලෙස අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පහදන්න. (ල. 5)

(ල. 10)